48

# හම්බන්තොට ප්‍රදේශයේ පවත්වනු ලබන අත්තකහ මැතිරීමෙ ශාන්ති කර්මය

*කේ. එම්. ටී. කෞෂල්‍යා* [1]

HU/2012/2236

ශ්‍රී ලංකාව තුළ ප්‍රධාන නර්තන සම්ප්‍රදායන් ත්‍රිත්වයක් දක්නට ලැබෙන අතර ඒවාට ආවේණික වූ ශාන්ති කර්ම වෙසෙසක් ද බැඳී පවතී. පහතරට නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ව පවතින පහතරට මුහුදු වෙරළබඩ ප්‍රදේශයේ ගර්භ සංරක්ෂණය අරමුණු කරගත් ශාන්ති කර්ම රාශියක් දක්නට ලැබේ. ඒ අතුරින් රට යකුම ශාන්ති කර්මයට ප්‍රධාන ස්ථානයක් හිමිවන අතර පාර්ශවීය වශයෙන් හා ගෘහස්ත වශයෙන් පවත්වනු ලබන ගර්භ සංරක්ෂණ පූජා ක්‍රමයන් ද දුලබ නොවේ. ඒ අතුරින් අත්තකහ මැතිරීමේ ශාන්ති කර්මය සුවිශේෂී වේ. වඳ ස්ත්‍රීන්ට දරු ඵල ලබා ගැනීම සඳහා ත් ඇති වී තිබෙන දරු ගැබ ආරක්ෂා කරගැනීම සඳහා ත් අත්තකහ මැතිරීම ශාන්ති කර්මයක් වශයන් පවත්වනු දැකිය හැකි ය. එහි පරමාර්ථය ගර්භ සංරක්ෂණය වුව ද වර්තමානයේ ජනශ්‍රැතියෙන් මෙම ශාන්ති කර්මය බැහැරවී යන බවක් පෙනෙන්නට තිබේ. ඊට ප්‍රධානතම හේතුව වශයෙන් ගිණිය හැක්කේ සාමාන්‍ය ජනතාව බටහිර වෛද්‍ය ප්‍රතිකාර කෙරෙහි වැඩි නැඹුරුවක් දැක්වීම ය. පාරම්පරික දේශිය වෛද්‍ය ක්‍රමය උපයෝගී කරගත් අත්තකහ මැතිරීමේ ශාන්ති කර්මය පාරම්පරික ජන සමාජය තුළ තවදුරටත් පිළිගත් වෛද්‍ය ක්‍රමයක් ලෙස පවත්වනු දැකිය හැක්කේ ඉතා සුළු වශයෙනි. මෙම අධ්‍යනයේ අරමුණ එලෙස වියැකී යන අත්තකහ මැතිරීමේ ශාන්ති කර්මය නැවත ජන සමාජය තුළ ස්ථාපිත කිරීම පිළිබඳ උපයෝගී කරගත හැකි ක්‍රමවේද සොයා ගැනීම කෙරෙහි යොමුවීම යි. මෙම අධ්‍යයනය සඳහා නියැදි ලෙස උපයෝගී කරගනු ලැබුවේ හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත් සූරියවැව බල කොට්ඨාසයේ පවුල් කිහිපයකි. මූලික වශයෙන් මෙම පර්යේෂණය තුළදී ඒ සඳහා දත්ත ලබා ගැනීමට සහභාගීත්ව නිරීක්ෂණය සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය යොදා ගන්නා ලදී. තෝරා ගත් බල ප්‍රදේශය තුළ අත්තකහ මැතිරීම සුලබව දක්නට නොලැබීම නිසා තොරතුරු ලබා ගැනීමේ අපහසුතාව, පාම්පරික ශිල්පීන්ගේ හිඟතාව හා ලිඛිත මූලාශ්‍ර දුලබ වීම යන කරුණු මෙම අධ්‍යයනයේදී ඇති වූ ගැටලු වේ.

ප්‍රමුඛ පද: අත්තකහ මැතිරීම, ශාන්ති කර්මය, සංරක්ෂණය

*1 ප්‍රාසංගික කලා (විශේෂවේදී) දෙවන වසර* kmtkaushi@gmail.com